# ලංසු සඳහා ආරාධනයයි - ප්‍රාදේශීය සභාව - හාලිඇල

| අ. අ. | කොන්ත්‍රාත් අංකය | විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය (සිවිල් වැඩ වටිනාකම) රු. මිලියන | අවම CIDA ලියාපදිංචිය (මහා මාර්ග) | ලංසු සුරක්ෂණ මුදල රු. | ලංසු ඇපකරය වලංගු කාල සීමාව (දින) | කොන්ත්‍රාත් කාල සීමාව | ලංසු ලිපි ලේඛන ගාස්තුව රු.(ආපසු නොගෙවන) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2/3/11/DITWA/RD/HEPS/04 | නෙළුදණ්ඩ මාර්ගය සංවර්ධනය කිරීම | 7.59 | C 8 ,C7, C6 | 76,000.00 | 01 DECE-2026 | මාස 03 | 3,000.00 |
| 2 | 12/3/11/DITWA/RD/HEPS/02 | රොසට්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 7.59 | C 8 ,C7, C6 | 76,000.00 | 01 DECE - 2026 | මාස 03 | 3,000.00 |
| 3 | 12/3/11/DITWA/RD/HEPS/07 | සල්ගාඩුවත්ත කොටඹහින්න මාර්ගය සංවර්ධනය කිරීම | 3.33 | C 9 ,C8, C7 | 33,000.00 | 03 NOVE-2026 | මාස 02 | 2,000.00 |
| 4 | 12/3/11/DITWA/RD/HEPS/06 | ගහ පාර සංවර්ධනය කිරීම | 6.08 | C 8 ,C7, C6 | 61,000.00 | 01 DECE 2026 | මාස 03 | 3,000.00 |
| 5 | 12/3/6/FA/PSDG/HALIELAPS/2/ 2026 | ගාවෙල උඩකැලේ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2.21 | C 9 ,C8, C7 | 22,000.00 | 03 NOVE-2026 | මාස 01 | 2,000.00 |

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධ වැඩිදුර තොරතුරු හාලි ඇල ප්‍රාදේශීය සභාවේ නිල වෙබ් අඩවිය වන https://haliela.ps.gov.lk වෙතින් ලබා ගත හැකි බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
හාලිඇල ප්‍රාදේශීය සභාව
දුරකථන - 0552294275
ඊ මේල් - halielapradeshiyasabhawa@gmail.com
දිනය - 2026/08/19

## හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය සඳහා
## ලංසු කොන්දේසි .2026 (දිවිවා)

- ❖ ජාතික තරඟකාරී ලංසුකරණ පිටිපාටිය හරහා ලංසු කැඳවීම සිදු කෙරේ.
- ❖ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසු වීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවී සිටිය යුතු අතර ඉහත වගුවෙහි දක්වා ඇති පරිද අවශ්‍ය අවම CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

- ❖ ලංසු ඇගයීමේ දි පහත දැක්වෙන සුදුසුකම් සලකා බලනු ලැබේ. ලංසු ලිපි ලේඛනයේ 04 වන කොටසෙහි ඇති සුදුසුකම් තොරතුරු යථාපරිදි නිවැරදිව සම්පූර්ණ කල යුතු අතර ඇගයීම් ක්‍රියාවලියේ දි සලකා බලනු ලැබේ.

  1.පසුගිය වසර පහ තුළ සමාන ස්වභාවයේ කර්මාන්ත එකක් සම්පූර්ණ කර තිබීම.
  2.මූල්‍ය හැකියාව හා ස්ථාවරත්වය
  3.දැනට කෙරෙමින් පවතින කර්මාන්තයන්හි මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

- ❖ ලංසුකරුවන් 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි විය යුතු අතර, ලියාපදිංචි සහතිකය ලංසු සමඟ ඉදිරිපත් කල යුතුය. ලියා පදිංචි සහතිකය හෝ ලියාපදිංචිය තහවුරු කෙරෙන ලිපි ලේඛන රහිත ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ ( රුපියල් මිලියන 05ට වැඩි කර්මාන්ත සඳහා පමණි) .

- ❖ ලිඛිත අයදුම් පත් සභාපති, ප්‍රාදේශිය සභාව, හාලි ඇල වෙත යොමු කිරීමෙන් හා ඉහත සඳහන් වගුවේ දක්වා ඇති ආකාරයට ලංසු ලිපි ලේඛන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව අභිලාෂී ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් **2026-08-19** වන දින සිට **2026-09-02** වන දින දක්වා පෙ.ව.**9.00** සිට ප.ව **4.00** දක්වා, රාජකාරී වේලාවන් තුළ දී මිල දී ගත හැක. ගෙවීම් මුදලින් සිදු කල යුතුය. ලංසු ලිපි ලේඛන ගාස්තු ගෙවීමෙන් තොරව පරික්ෂා කර බැලිය හැක.

- ❖ ලංසු සුරක්ෂණ ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක් මගින් හෝ අනුමත ආකෘතියේ සඳහන් ආකාරයට හා අනුකූල වන පරිදි බැංකු ඇපකරයක් මඟින් හෝ මුදලින් ලැබීමට සැලැස් විය යුතුය. ලංසු සුරක්ෂණය එවනු ලබන්නේ බැංකු ඇපකරයක් ආකාරයෙන් නම් එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත වානිජ බැංකුවක් මඟින් ලබා ගත යුතු අතර, එය ලංසු ලේඛනයන්හි දක්වා ඇති අනුමත ආකෘතියට අනුකූලවන අයුරින් ඉදිරිපත් කළ යුතුය. (සම්මත ආකෘතිය) ලංසු ඇපකරය කොන්දේසි විරහත වෙනස් කළ නොහැකි ප්‍රසම්පාදන අස්ථිත්වයේ ප්‍රථම ලිඛිත ඉල්ලුමට ගෙවීම් ලබා ගත හැකි බැංකු ඇපකරයක් විය විය යුතුය. ලංසු සුරක්ෂණය ඉහත වගුවේ දක්වා ඇති ආකාරයට වලංගුභාවයෙන් යුක්ත විය යුතුය.

- ❖ යථා පරිදි සම්පූර්ණ කරන ලංසු අනු පිටපත් සහිතව ''මුල් පිටපත'' ''අනු පිටපත'' ලෙස සඳහන් කොට වෙන් වෙන් වශයෙන් කවරයන්හි බහා එම කවර දෙක නැවත මුද්‍රා තැබූ එක් කවරයක බහා කර්මාන්තයේ නම එහි වම් පස උඩු කෙළවරෙහි සටහන් කොට, අදාළ ප්‍රසම්පාදන කමිටුවට **2026-09-03** වන දින ප.ව.**12.00** පැයට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. මුද්‍රා තැබූ ලංසු ලිපි ලේඛන සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශිය සභාව,හාලි ඇල යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහා ලීම මඟින් ලැබීමට සැලැස්විය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතිකෂේප කරනු ලැබේ.

- ❖ අනු පිටපත, මුල් පිටපතෙහි සියලුම පිටු සහතික කරන ලද ඡායා පිටපතක් විය යුතුය.

- ❖ අභිලාෂී ලංසුකරුවන් හට මේ පිළිබඳව වැඩිමනක් තොරතුරු හාලිඇල ප්‍රාදේශිය සභා කාර්යාලය මඟින් ලබා ගත හැකිය. (දුරකථන අංක - **0552294275** ඔස්සේ ලබා ගත හැකිය.)

- ❖ ලංසු **2026.09.03** වන දින ප.ව.**12.00** පැයට හාලි ඇල ප්‍රාදේශිය සභාවේ දී, මේ සඳහා පැමිණීමට කැමැත්තක් දක්වන ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන් ඉදිරිපිට දී විවෘත කිරීම සිදු කරනු ලැබේ.

- ❖ ලැබී ඇති ලංසු අතුරින් ඕනෑම යෝග්‍ය ලංසුවක් භාර ගැනීමේ හා ප්‍රතික්ෂේප කිරිමේ පූර්ණ බලය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තිරණය අවසන් තීරණය වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
හාලිඇල ප්‍රාදේශිය සභාව
දුරකථන - 0552294275
ඊ මේල් - halielapradeshiyasabhawa@gmail.com
දිනය -2026-08-19